ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**ආරක්ෂක අමාත්‍යාංශය**

**වාණිජ පුපුරණ ද්‍රව්‍ය ,ගිනි අවි සහ පතරොම්**

**මිලදී ගැනීමේ ඒකකය**

# <u>ලංසු කැඳවීමේ ආරාධනය</u>

**ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාණිජ පුපුරණ ද්‍රව්‍ය ,ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය වෙත**

**විදුලි ඩෙටොනේටර් (6 Mtr) අංක 1,000,000 ක් මිලදී ගැනීම**

**කොන්ත්‍රාත් කැඳවීමේ අංකය : MOD/SLN/02/2025**

1. ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය (CEFAP Unit) වෙත පහත සඳහන් අයිතම මිලදී ගැනීම සඳහා යෝග්‍ය සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් දැන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් (MOD) වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සභාපතිවරයා මුද්‍රා තැබූ ලංසු කැඳවයි.

- කොන්ත්‍රාත් කැඳවීමේ අංකය : **MOD/SLN/02/2025**
- ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය වෙත **විදුලි ඩෙටොනේටර් (Electric Detonator 6 Mtr) අංක 1,000,000** ක් මිලදී ගැනීම.

විකල්ප හෝ විකල්පිත ලංසු සලකා බලනු නොලැබේ. එක් ලංසුකරුවකුට එක් ලංසුවක් පමණක් ඉදිරිපත් කළ හැක.

2. දේශීය නිෂ්පාදකයින්, නිෂ්පාදකයින් / විදේශීය ප්‍රධානීන්ගෙන් දේශීය නියෝජිතයන්, ආනයනය සහ සැපයුම් හරහා ලංසු කැඳවනු ලැබේ.

3. මෙම ලංසු ක්‍රියාවලිය ජාත්‍යන්තර තරඟකාරී ලංසු (ICB) ක්‍රමය යටතේ සිදු කරනු ලබන අතර ව්‍යාපෘතිය ශ්‍රී ලංකා රජයේ (GOSL) අරමුදල් මඟින් මුදල් සැපයෙනු ඇත. අදාළ කොන්දේසි ශ්‍රී ලංකා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා මූල්‍ය නියෝග අනුව පාලනය කරනු ලැබේ.

4. මෙම ලංසු කැඳවීම සඳහා මූල්‍ය ප්‍රකාශන, පසුගිය වසර 3 සඳහා අතීත කාර්ය සාධන වාර්තා, මිලදී ගැනීම සඳහා ගෙවීම් කළ කුවිතාන්සිය, ලංසු ලේඛනය සහ ඇටෝර්නි බලපත්‍රය (Power of Attorney) සඳහා බලයලත් ප්‍රමිති සහතික ඉදිරිපත් කළ යුතුය.

5. මෙම ටෙන්ඩර් යටතේ ඉදිරිපත් කරන ලංසු විවෘත කල දින සිට **2026 ජුලි මස 13 වන දින** දක්වා වලංගු විය යුතුය.

6. ලංසු සමඟ **2026 සැප්තැම්බර් මස 07** දින දක්වා වලංගු ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු අතර එය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කළ යුතුය. ලංසු ඇපකරය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් විසින් නිකුත් කළ යුතු අතර එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි මුල් ස්වරූපයෙන් (බැංකුවේ මුල් ලිපි ශීර්ෂය මත) අනුමත කරන ලද අතර කොන්දේසි විරහිත, ආපසු හැරවිය නොහැකි සහ ඉල්ලුම මත නිකුත් කළ යුතුය. ලංසු ඇපකරයේ මුදල 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ නියම කර ඇති පරිදි **රුපියල් 7,000,000.00** විය යුතුය.

7. ලංසු ලේඛන නිකුත් කිරීම, භාර ගැනීම හා වසා දැමීමේ දිනයන් හා වේලාවන් පහත පරිදි වන අතර අදාළ ලංසුකරුවන් හෝ ඔවුන්ගේ අධිකාරී නියෝජිතයන්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැක. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(අ) ලංසු ලේඛන නිකුත් කිරීම ආරම්භ වන දිනය - **2026 පෙබරවාරි මස 02**

(ආ) ලංසු ලේඛන නිකුත් කිරීමේ අවසන් දිනය හා වේලාව - **2026 මාර්තු මස 16 වන දින 1500 පැය දක්වා.**

(ඇ) ලංසු භාර ගැනීම/වසා දැමීමේ අවසන් දිනය හා වේලාව - **2026 මාර්තු මස 17 වන දින 1100** පැය දක්වා

(ඈ) ලංසු විවෘත කිරීමේ ස්ථානය, දිනය හා වේලාව - ආරක්ෂක අමාත්‍යාංශය, ප්‍රසම්පාදන ශාඛාව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, ශ්‍රී ලංකාව, **2026 මාර්තු මස 17 වන දින 1100 පැය**.

8. ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් පහත ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැක.

ප්‍රධාන මූල්‍ය නිලධාරී (ප්‍රසම්පාදන හා ව්‍යාපෘති)
ප්‍රසම්පාදන අංශය,
දෙවන මහල,
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මුලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ,
ශ්‍රී ලංකාව

ඒ සඳහා වැඩ කරන දිනවල 0900 සිට 1500 පැය අතර, **2026 පෙබරවාරි මස 02** වන දින සිට **2026 මාර්තු මස 16** වන දින දක්වා කාලය තුළ ආරක්ෂක අමාත්‍යාංශයට ආපසු නොගෙවන ගාස්තුව **රු. 60,000.00** මුදලින් ගෙවීමෙන් පසු ලංසු ලේඛණ ලබා ගත හැකිය.

ලංසු ඉදිරිපත් කිරීමේදී, ලංසු ලේඛනයේ දක්වා ඇති ආකෘති පමණක් භාවිත කළ යුතුය. මුල් ලංසුව හා පිටපත් ලංසුව වෙන වෙනම මුද්‍රා තබා එක් මුද්‍රා කළ කවරයක දමා ලියාපදිංචි තැපෑලෙන් යැවීම හෝ ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන ශාඛාවේ සපයා ඇති ටෙන්ඩර් පෙට්ටියට, අනුක්‍රමික අංක 07 හි දක්වා ඇති දිනය හා වේලාවට පෙර තැන්පත් කළ යුතුය.

9. උනන්දුවක් ඇති ලංසුකරුවන්ට, ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කිරීම/මිලදී ගැනීම සඳහා, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ සම්පූර්ණ ලේඛන කට්ටලයක් ආරක්ෂක අමාත්‍යාංශය, ප්‍රසම්පාදන අංශය, ආරක්ෂක මුලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, ශ්‍රී ලංකාව (දුරකථන: 011-2390719, ෆැක්ස්: 011-2390720, ඊ-තැපැල: procurement@defence.lk) වෙතින්, ප්‍රධාන මූල්‍ය නිලධාරී (ප්‍රසම්පාදන හා ව්‍යාපෘති) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් **2026 පෙබරවාරි මස 02** වන දින සිට **2026 මාර්තු මස 16** වන දින දක්වා වැඩ කරන දිනවල **0900 සිට 1500** පැය අතර ලබා ගත හැක.

10. ආරක්ෂක අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලංසු ලේඛනය මිලදී ගැනීමට පෙර, 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කරන ලෙස ලංසුකරුවන් හට දැනුම් දෙනු ලැබේ.

11. ලංසු පහත ලිපිනයට **2026 මාර්තු මස 17 වන දින 1100** පැයට පෙර හෝ ඊට පෙර භාර දිය යුතු අතර, ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රධාන මූල්‍ය නිලධාරී (ප්‍රසම්පාදන හා ව්‍යාපෘති)
ප්‍රසම්පාදන අංශය,
දෙවන මහල,
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මුලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ,
ශ්‍රී ලංකාව

12. ලංසු ලේඛන පරීක්ෂා කිරීම/ මිලදී ගැනීම සහ ලංසු විවෘත කිරීම සඳහා සහභාගී වන පුද්ගලයින්ගේ නාමයන්, ජාතික හැඳුනුම්පත්/ගමන් බලපත්‍ර අංකයන්, ආරක්ෂක අමාත්‍යාංශ භූමියට ඇතුළුවීමට දින 03 කට පෙර ලිඛිතව ප්‍රධාන මූල්‍ය නිලධාරී (ප්‍රසම්පාදන හා ව්‍යාපෘති), ආරක්ෂක අමාත්‍යාංශය වෙත දැනුම් දිය යුතුය.
(දුරකථන: 011-2390719, ෆැක්ස්: 011-2390720, ඊ-තැපැල: procurement@defence.lk)

13. වැඩි විස්තර සඳහා විමසීම්.

| | | |
|---|---|---|
| ලිපිනය: | ප්‍රධාන මූල්‍ය නිලධාරී (ප්‍රසම්පාදන හා ව්‍යාපෘති)<br>ප්‍රසම්පාදන අංශය,<br>දෙවන මහල,<br>ආරක්ෂක අමාත්‍යාංශය,<br>ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,<br>ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, ශ්‍රී ලංකාව | දුරකථන අංකය: 00-94-11-2390719<br>ෆැක්ස්: 00-94-11-2390720<br>ඊ-තැපැල:procurement@defence.lk |
| ලිපිනය: | අධ්‍යක්ෂ,<br>වාණිජ පුපුරණ ද්‍රව්‍ය,<br>ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය<br>වැලිසර<br>රාගම. | දුරකථන අංකය: 00-94-11-2958227<br>00-94-11-2955514<br>ඊතැපැල:director.cefap@gmail.com |

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව